**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } **ED/04/60/14/01/උසස්කිරීම්**
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } **2020.02.**

**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු වෙත,**

**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු වෙත,**

**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරීන්ගේ උසස්වීම් සම්බන්ධයෙනි.</u>**

**මාගේ සමාංක හා 2018.10.26 දිනැති ලිපිය හා බැදේ.**

**02.** **උක්ත ලිපිය මගින් දක්වා ඇති පරිදි විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංශෝධනය කිරීම මත, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2012 වර්ෂයන්හිදී විදුහල්පති සේවයේ 2-II ශ්‍රේණියට අධිසේවක පත්වීම් ලැබ ඉන් අනතුරුව 2014.01.01 දිනට නිත්‍ය සේවක සංඛ්‍යාවට විධිමත්ව අන්තර්ග්‍රහණය වූ නිලධාරින් විදුහල්පති සේවයේ I ශ්‍රේණියට අන්තර්කාලීන විධිවිධාන බලපැවැත්වෙන කාල සීමාව තුල උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබයි.**

**03.** **එබැවින් ව්‍යවස්ථානුකූලව සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිළධාරීන් සඳහා ඔවුන්ට අදාළ වන මෙහි ඇමුණුම් 01 දක්වා ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කර, එහි සඳහන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් සහතික කරන ලද, සියලුම ලේඛන ද සමග අදාළ ශ්‍රේණි උසස්කිරීම් සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ. මෙම අයදුම් පත්‍රය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක මගින් යොමු විය යුතු අතර,අයදුම්කරුවන් ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව ශ්‍රේණි උසස්වීම් සඳහා සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් අයදුම් පත්‍රයේ II කොටසෙහි (ඇමුණුම 02) දක්වා ඇති උපදෙස් පත්‍රිකාව ප්‍රකාරව සම්පූර්ණ කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිතව, " සහකාර ලේකම්,විදුහල්පති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල," යන ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.**

**04.** **(i) තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014(viii) හි 2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම අවශ්‍යතාවක් ලෙස බඳවා ගැනීම් පරිපාටිවල සහ සේවා ව්‍යවස්ථාවල සඳහන්ව තිබීම නිසා මෙතෙක් ශ්‍රේණි උසස්වීම් ලබාගත නොහැකි වූ නිලධරයන්ට රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම හැර අනිකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් එම ශ්‍රේණි උසස්වීම් ලබා දීමට කටයුතු කලයුතු වේ.**

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk

**(ii)** එබැවින් **2009** වර්ෂයේ සිට **2012** වර්ෂය තෙක් ශ්‍රී ලංකාවිදුහල්පති සේවයේ පත්වීම් ලබා මේ වන විට අමාත්‍යාංශය වෙත උසස්වීම් සඳහා අයදුම්කර ඇති නමුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ නොකිරීම මත උසස්වීම් ලබාගත නොහැකි වූ නිලධරයන්ට හා මේ වන විට උසස්වීම් සඳහා අයදුම්කර නොමැති නමුත් උක්ත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **1/2014(viii)** විධිවිධාන ප්‍රකාරව ශ්‍රේණි උසස්වීම් ලබාදිය හැකි නිලධරයන්ට උසස්වීම් ලබා දීමට කටයුතු කිරීම සඳහා මේ සමග අමුණා ඇති ඇමුණුම **03** හා **04** අනුව එම නිලධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.

**05.** ඒ අනුව, ඔබ කලාපයට අයත් සියලුම විදුහල්පති ශ්‍රේණිධාරින් ඔවුන්ගේ උසස්වීම් සඳහා අයදුම් කල යුතු ක්‍රමවේදය පිළිබඳවද, දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්:

**01.** කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (......................................... ) - කරු. අ.ක.ස. හා දැ.ගැ.ස